Study Smart with Sandeepa

# LKAS 37
# වෙන්කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්

Sandeepa Jayasekera

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner.

1

## වෙන්කිරීම් තුලින් ලාභය අතිශයෝක්තියක් පෙන්වන එක වළක්වන්න LKAS 37 හඳුන්වා දුන්නා




2

JMC vLearning
"your virtual learning partner"


ක්ෂය
කල්බදු
ක්‍රමක්ෂය
විෂය
පථයට
එන්නේ
නැති
හානිකරණ
බදු
පාරිභෝගික
ගිවිසුම්
3

3


LKAS 37
වෙන්කිරීම්
අසම්භාව්‍ය
වගකීම්
අසම්භාව්‍ය
වත්කම්
නිර්වචන
හඳුනාගැනීම
මිණුම්කරණය

4

# 37 ප්‍රමිතය ඉගෙනගනිද්දි මතක තියාගන්න ඕනි කරුණු

| | |
|---|---|
| සැබැවින්ම ස්ථිර බැඳීම | වීමට ඇති සම්භාවිතාව 100%ට ආසන්න |
| ඇතිවීමට හැකියාවක් ඇති බැඳීම | වීමට ඇති සම්භාවිතාව 50%ට වැඩි |
| ඇති විය හැකි බැඳීම | වීමට ඇති සම්භාවිතාව 50% පමණ |
| ඇති වීමේ හැකියාව දුරස්ථ බැඳීම | වීමට ඇති සම්භාවිතාව 0ට ආසන්න |





# වගකීම් යනු

- අතීත සිදුවීමක ප්‍රතිඵලයක් මත ඇති වූ
- ආර්ථික සම්පත් පවරා දීම සම්බන්ධයෙන්
- ව්‍යාපාර ඒකකයක් සතු
- වර්තමාන බැඳීම


වගකීමක් ඇති විය හැකි ආකාර
නීතිමය
ව්‍යවස්ථාපිත
නීතියක්
ගිවිසුමක්
සම්මුතික
අතීත භාවිතයන්, ප්‍රසිද්ධ ප්‍රකාශ හෝ ආයතනික ප්‍රතිපත්ති මත වගකීම් භාරගැනීම
එම වගකීම් ඉටුකරන බවට වලංගු අපේක්ෂාවක් නිර්මාණය වීම
7

7


වෙන්කිරීමක් (ප්‍රතිපාදන) යනු
ප්‍රමාණය
හෝ
කාලය
පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති
වගකීමක්
Sandeepa Jayasekera - JMC
8

8

# වෙන්කිරීම් හඳුනාගැනීම් නිර්ණායක

1. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇති වූ වර්තමාන බැඳීමක් වීම (නෛතික හෝ සම්මුතික)



2. බැඳීම නිරාකරණය කරද්දි ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා යෑමට හැකියාවක් තිබීම



3. බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි වීම



9

# වෙන්කිරීම් මිණුම්කරණය

වාර්තාකරණ දින වන විට

වගකීම සත්‍ය වශයෙන් පියවන විට

ගෙවන ප්‍රමාණය පිළිබඳ

හොඳම ඇස්තමේන්තුව



10

JMC vLearning "your virtual learning partner"




11

# අපේක්ෂිත අගය

- විශාල ප්‍රමාණයක අයිතම ඇති විට මෙම ක්‍රමය භාවිතා කරයි
- අතීත අත්දැකීම් සහ වර්තමාන තොරතුරු තුලින් විය හැකි තත්ත්වයන් අනුමාන කිරීම සහ සම්භාවිතාවයන් තීරණය කිරීම මෙහිදී සිදු වේ.
- එම සම්භාවිතයන් මත බර තැබූ අගයේ එකතුව ගනී




Sandeepa Jayasekera - JMC 12

12

JMC vLearning "your virtual learning partner"

# අසම්භාව්‍ය වගකීම්

JMC Jayasekera Management Centre 13

13

## ආයතනයට විරුද්ධව ඇති තවමත් විභාග වෙමින් පවතින නඩු

ඉන්දු සමාගම යෝගට් නිෂ්පාදන ව්‍යාපාරයක නියැලී සිටී. ඔවුන් විසින් අලෙවි කල යෝගට් විෂ වීමකින් පාරිභෝගිකයෙකුට අසාත්මිකතාවයක් ඇති විය. මේ පිළිබඳව රු. මිලියන 2 ක වන්දි ඉල්ලා ආයතනයට විරුද්ධව නඩුවක් පවරා ඇත. නඩුව තවමත් අධිකරණයේ පවතී.

තවමත් නඩුව අවසන් නැති නිසා ඉන්දු සමාගමට වන්දිය ගෙවන්නට වගකීමක් නැත.
නඩුව ඉදිරියට යන ආකාරය අනුව වරදකරු වීමට හෝ නොවීමට ඉඩ ඇත.
නඩුවේ කටයුතු සිදුවන ආකාරය ඉන්දු සමාගමේ පාලනයෙන් තොර වේ.
එසේ නම් මෙය වර්තමාන බැඳීමක් නොව ඇති විය හැකි බැඳීමකි.

JMC Jayasekera Management Centre 14

14

JMC vLearning "your virtual learning partner"

## බැංකු ණයකට වී ඇති ඇපවීම

සුනිල් විසින් කමල් ලබාගත් රු. මිලියනයේ ණය මුදලට ඇපකරුවෙකු ලෙස අත්සන් තබා ඇත.

කමල් ගත් ණය මුදල් නිසා සුනිල්ට වර්තමාන බැඳීමක් ඇතිවන්නේ නැත.
ඒත් කමල් ණය ගෙවන්නේ නැතිව පැහැර හැරියහොත් සුනිල්ට එම ණය වගකීම භාරවිය හැකිය.
කමල් ණය ගෙවීමට හෝ නොගෙවීමට ඉඩ ඇත. එය සුනිල්ගේ පාලනයෙන් තොර වේ.
එසේ නම් මෙය වර්තමාන බැඳීමක් නොව ඇති විය හැකි බැඳීමකි.





## විශ්වසනීයව මැනිය නොහැකි වෙන්කිරීම

නිසාකෝ සමාගම පළමු වරට ජංගම දුරකථන අලෙවි කිරීම ආරම්භ කරන ලදී. විකුණන සෑම ජංගම දුරකථනයකටම මාස 6 ක ප්‍රතිඥාභාරයක් ලබා දී ඇත. නිසාකෝ සමාගමේ ප්‍රතිඥාභාර බැඳීම කොපමණ වේ දැයි විශ්වසනීයව මැනීමට නොහැකි වේ.

## අනාගත ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාම අවිනිශ්චිත වීම

ජානක සමාගම සිය ආයතනයට උපදෙස් සපයන විශේෂඥයකු හට උපයන ලාභයෙන් 10% ගෙවීමට එකඟ විය. කෙසේ වෙතත් මෙහෙයුම් වියදම් ඉහළ යාම මත ආයතනය අලාභ ලබමින් පවතී. මේ නිසා විශේෂඥයාට ගෙවීමට සිදුවේද? නැත්ද? යන්න අවිනිශ්චිත වේ.

## අසම්භාව්‍ය වගකීමක් කියන්නේ

ආයතනයේ පාලනයෙන් තොර

අනාගත අවිනිශ්චිත සිදුවීම් වීම හෝ නොවීම මත ඇතිවන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇති වූ

විය හැකි බැඳීම්

**හෝ**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇති වූ

අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයෙන් බැහැරට ගලා යෑමේ සම්භාවිතාවය නැති හෝ

බැඳීමේ වටිනාකම විශ්වසනීයව තක්සේරු කළ නොහැකි වර්තමාන බැඳීම්



## අසම්භාව්‍ය වගකීම් සඳහා ගිණුම්කරණය

හඳුනාගැනීම් නිර්ණායක සම්පූර්ණ නොවන නිසා හඳුනාගත නොහැක.

### හෙළිදරව් කිරීම්

- ස්වාභාවය
- මූල්‍ය ඇස්තමේන්තුවක්
- කවර හෝ ප්‍රතිපූර්ණයක් ලැබීමට ඇති හැකියාව
- සම්පත් පිටතට ගලා යාමේ අගය හෝ කාල වකවානු පිළිබඳ අවිනිශ්චිතතා විස්තර කිරීමක්

## ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම් තීරණ ගස




19

# අසම්භාව්‍ය වත්කම්



20

JMC vLearning "your virtual learning partner"

## ආයතනය විසින් වන්දි ඉල්ලා පවරා ඇති නඩුවක්

සසිරි සමාගමේ කීර්තිනාමයට හානි වන ලෙස ලලිතා සමාගම කටයුතු කිරීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලා නඩුවක් ගොනුකර ඇත. නඩුව තවමත් අධිකරණයේ විභාග වෙමින් පවතී.

වන්දි ලැබීම හෝ නොලැබීම තීරණය වන්නේ අධිකරණයේ කටයුතු සිදුවන ආකාරයට වන අතර එය සසිරි සමාගමේ පාලනයෙන් තොර වේ. එමනිසා වන්දිය ඇති විය හැකි වත්කමකි.

JMC Jayasekera Management Centre 21



## ස්වාධීන විශේෂඥ වාර්තාවක් මත තීරණය වන ප්‍රතිඥාභාර

ශාලිත සමාගම ඉදිකිරීම් කටයුතු සිදු කරයි. ඔවුන් සිදු කළ ඉදිකිරීමක පුපුරායෑම් කිහිපයක් ඇති වී තිබේ. ශාලිත සමාගමේ අදහස මෙයට හේතුව ඔවුන් යෙදූ කොන්ක්‍රීට් මිශ්‍රණයේ තිබූ අඩු ගුණත්වය බවයි. ඒ වෙනුවෙන් ඔවුන් කොන්ක්‍රීට් මිශ්‍රණය සැපයූ ආයතනයේ සැපයුම්කරුගේ ප්‍රතිඥාභාරය ඉල්ලා ඇත. එහෙත් සැපයුම්කරු එම ප්‍රතිඥාභාර ගෙවීම ස්වාධීන විශේෂඥයෙකුගේ වාර්තාවක් අනුව සිදු කරන බව පවසා ඇත.

ප්‍රතිඥාභාරය ලැබීම හෝ නොලැබීම තීරණය වන්නේ ස්වාධීන විශේෂඥයාගේ වාර්තාව මත වේ. එම වාර්තාව ආයතනයේ පාලනයෙන් තොර වේ. එමනිසා ප්‍රතිඥාභාරය ඇති විය හැකි වත්කමකි.

JMC Jayasekera Management Centre 22



JMC vLearning
"your virtual learning partner"

## අසම්භාව්‍ය වත්කම්

- ආයතනයේ පාලනයෙන් තොර
- අනාගත අවිනිශ්චිත සිදුවීම් වීම හෝ නොවීම මත ඇතිවන
- අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇති වූ
- වියහැකි වත්කම්

23

23

## අසම්භාව්‍ය වත්කම් ගිණුම් තැබීම

හඳුනාගැනීමේ නිර්ණායක සම්පූර්ණ වන්නේ නැති නිසා හඳුනාගත නොහැක.

වත්කම ලැබීමට හැකියාවක් තිබේ නම් පමණක් කළ යුතු

### හෙළිදරව් කිරීම්

- ස්වාභාවය
- මූල්‍ය ඇස්තමේන්තුවක්

24

24

MC vLearning
"your virtual learning partner"

# අසම්භාව්‍ය වත්කම් තීරණ ගස




25

25

# ප්‍රශ්න අංක 1

පහත වගකීම් නෛතික බැඳීම්ද සම්මුතික බැඳීම් ද යන්න සඳහන් කරන්න

| | |
|---|---|
| 1. බැංකු ණය | |
| 2. වෙළඳ ණයහිමියා | |
| 3. වරණීය කොටස් | |
| 4. සේවක අර්ථසාධක | |
| 5. සේවක පාරිතෝශික | |
| 6. ප්‍රතිඥාභාර | |
| 7. ගෙවිය යුතු ප්‍රසාද දීමනා | |

Sandeepa Jayasekera - JMC

26

26

JMC vLearning "your virtual learning partner"

| | |
|---|---|
| 8. උපචිත විදුලිය | |
| 9. ගෙවිය යුතු ගෙවල් කුළී | |
| 10. ව්‍යාපාරික අංශයක වැසීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ අතර ඒ බව අදාළ සේවකයන්ට දැනුම් දීම මත ඇතිවන ගෙවිය යුතු වන්දි | |





## ප්‍රශ්න අංක 2

පහත වගකීම් වෙන්කිරීම් ද නැත් ද යන්න සඳහන් කරන්න

| විස්තරය | අවිනිශ්චිත කාලයක් තිබේද? | අවිනිශ්චිත ප්‍රමාණයක් තිබේද? | වෙන්කිරීමක් ද? |
|---|---|---|---|
| 1. වෙළඳ ණයහිමිහියෝ | | | |
| 2. උපචිත ජල විදුලිය | | | |
| 3. සේවක පාරිතෝශික | | | |
| 4. ප්‍රතිශ්‍රුතාභාර | | | |
| 5. ගෙවිය යුතු ගොඩනැගිලි කුළී | | | |





JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 3

| විස්තරය | අතීත ගනුදෙනුවක් මත ඇති වූ වර්තමාන බැඳීමක් ද? | ආර්ථික සම්පත් බැහැරට ගලා යෑමේ සම්භාවිතාව | විශ්වසනීය ඇස්තමේන්තුව |
|---|---|---|---|
| 1. උපචිත විදුලිය ගෙවීම් | | | |
| 2. ලාභය මත ගෙවාගෙන පැමිණි ප්‍රසාද දීමනා | | | |
| 3. ප්‍රථම වතාවට අලෙවි කෙරෙන මාස 06ක ප්‍රතිඥාභාරයක් සහිත පරිගණක | | | |

Sandeepa Jayasekera - JMC 29

29

| විස්තරය | අතීත ගනුදෙනුවක් මත ඇති වූ වර්තමාන බැඳීමක් ද? | ආර්ථික සම්පත් බැහැරට ගලා යෑමේ සම්භාවිතාව | විශ්වසනීය ඇස්තමේන්තුව |
|---|---|---|---|
| 4. අධිකරණය විසින් වරදකරු යැයි තීරණය කිරීම නිසා පාරිභෝගිකයාට ගෙවීමට ඇති වන්දිය | | | |
| 5. අබාන්ස් සමාගම අලෙවි කරන ශීතකරණ මත ලබා දී ඇති ප්‍රතිඥාභාරය | | | |
| 6. ව්‍යාපාරයට එරෙහිව සේවකයෙකු පැවරූ නඩුව | | | |

Sandeepa Jayasekera - JMC 30

30

JMC vLearning "your virtual learning partner"

| විස්තරය | අතීත ගනුදෙනුවක් මත ඇති වූ වර්තමාන බැඳීමක් ද? | ආර්ථික සම්පත් බැහැරට ගලා යෑමේ සම්භාවිතාව | විශ්වසනීය ඇස්තමේන්තුව |
|---|---|---|---|
| 7. ව්‍යාපාරයේ එක් අංශයක් වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළද එය තවමත් සේවකයන්ට දැනුම් දී නැත | | | |
| 8. ව්‍යාපාරයේ එක් අංශයක් වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ අතර එය සේවකයන්ට දැනුම් දී ඇත | | | |



## ප්‍රශ්න අංක 4

සසිඳු ව්‍යාපාරයේ මූල්‍ය වර්ෂය මාර්තු 31 න් අවසන් වේ. මාර්තු මාසය සඳහා වන විදුලි බිල රු. 15,000 ක් බව අප්‍රේල් 05 දැනගත් අතර එදිනම එය ගෙවා දමන ලදී.

මාර්තු මස විදුලි බිලේ ද්විත්ව සටහන දක්වන්න



JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 5

ශෂිකලා සමාගම අලෙවිකරණ සෑම Huawei ජංගම දුරකථනයක් සඳහාම වසරක ප්‍රතිශ්‍රාභාරයක් ලබා දේ. සමාගමේ පසුගිය අත්දැකීම් අනුව සියළු විකුණුම් වලින් 8%ක ප්‍රමාණයක් ප්‍රතිශ්‍රාභාර ඉල්ලීම් කර ඇත. ඒ සියළු අවස්ථා වලදී ජංගම දුරකථනයේ වටිනාකමින් හරි අඩකට ආසන්න වියදමක් දරා ඇත.

වසර සඳහා මුළු Huawei ජංගම දුරකථන විකුණුම් වටිනාකම රු. මිලියන 5 ක් වේ. එමෙන්ම ඔවුන් විකුණන Nokia ජංගම දුරකථනයේ තාක්ෂණික ගැටළුවක් හේතුවෙන්, මුළු විකුණුම් වලින් 25%ක් සඳහා සම්පූර්ණ වියදම ප්‍රතිපූර්ණය කිරීමට සිදු වේ යැයි අපේක්ෂිතය. Nokia ජංගම දුරකථන මුළු විකුණුම් රු.මිලියන 4කි.

ප්‍රතිශ්‍රාභාර වෙන්කිරීම කොපමණද?



## ප්‍රශ්න අංක 6

ලකී සමාගම සිය නවතම ගොඩනැගිල්ල ඉදිකරමින් සිටී. ඔවුන්ගේ මූල්‍ය වර්ෂය මාර්තු 31 න් අවසන් වේ. මාර්තු 31 දිනට කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති බැඳීම තීරණය කරන්නේ ගොඩනැගිල්ලේ සම්පූර්ණ වී ඇති ප්‍රමාණය පදනම් කරගෙන වේ. මේ සඳහා ඉංජිනේරුවෙකුගේ සහය ගැනීමට තීරණය විය. ඉංජිනේරුවා විසින් මේ වන විට 50% ක වැඩ අවසන් බවත් එහි රු. මිලියන 7 ක වටිනාකමක් ඇති බවටත් තක්සේරු කරන ලදී. මේ වන විට කොන්ත්‍රාත්කරුට රු. මිලියන 3 ක් ගෙවා ඇත.

කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු බැඳීම කොපමණද?



JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 7

ශාන්ත සමාගම 06 මාසික ප්‍රතිඥාභාරයක් සහිත ඔර්ලෝසු විකුණයි. 20X1 වර්ෂයේ ඔවුන් විකුණූ සියළු ඔර්ලෝසුවල සුළු දෝෂයක් තිබුණොත් අළුත්වැඩියා වියදම රු. මිලියන 1 ක් වේ. සුළු දෝෂ තිබීමට ඇති සම්භාවිතාවය 20% කි.
විකුණූ සියළු ඔර්ලෝසුවල විශාල දෝෂ තිබුණහොත් අළුත්වැඩියා වියදම රු. මිලියන 4 ක් වේ. විශාල දෝෂ තිබීමට ඇති සම්භාවිතාවය 5% කි.
කිසිදු දෝෂයක් නොතිබීමට ඇති සම්භාවිතාවය 75% කි. ප්‍රතිඥාභාර බැඳීමේ අපේක්ෂිත අගය ගණනය කරන්න.

Sandeepa Jayasekera - JMC 35

35

## ප්‍රශ්න අංක 8

2018 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා **XYZ සමාගමේ** පහත තොරතුරු ලබාදී ඇත.

(1) අස්තිත්වය වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. එම වගකීම් සහතිකය මගින් භාණ්ඩ මිලදී ගෙන පළමුවන මාස හය ඇතුලත සිදුවන නිෂ්පාදන දෝෂ වෙනුවෙන් සිදු කරනු ලබන නඩත්තු කිරීම් සඳහා දරනු ලබන පිරිවැය ආවරණය කරනු ලබයි. අස්තිත්වයේ අතීත අත්දැකීම් අනුව විකුණුම්වලින් 2% ක ප්‍රමාණයක් වගකීම් සහතික මත නඩත්තු පිරිවැය ලෙස දැරීමට සිදුවන අතර, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 30 ක විකුණුම් වාර්තාගත වී ඇත. වර්ෂය පුරා විකුණුම් සමාන ලෙස සිදු වී ඇති බව උපකල්පනය කරන්න.

Sandeepa Jayasekera - JMC 36

36

JMC vLearning "your virtual learning partner"

(2) 2015/16 තක්සේරු වර්ෂයට අදාලව දැරූ වියදම්වල ඉඩ නොදුන් කොටසක් සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රු. මිලියන 2.5 ක ආදායම් බදු තක්සේරුවක් එවා තිබුණි. පිළිතුරු ලිපි කිහිපයක් සහ වියදමට සම්බන්ධ ලියකියවිලි යැවීමෙන් පසු අවසන් ඇස්තමේන්තුවල ලෙස රු. මිලියන 2 ක් බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2018 මාර්තු 30 දින නියම කරන ලදි. මෙය මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි.



(3) 2018 මාර්තු 25 සේවකයෙකු විසින් කරන ලද වංචාවකට සමාගම විසින් එම සේවකයා සේවයෙන් පහකරන ලද අතර, සේවකයා එකී සිද්ධියට, සමාගමට එරෙහිව නඩුවක් පවරා ඇත. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමත කළ දිනය දක්වා සමාගමේ නීතිඥයන්ගේ උපදේශය වූයේ මෙකී සිද්ධියට අදාලව සමාගම වෙත වගකීමක් ඇතිවීමේ හැකියාවක් නොමැති බවයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

LKAS 37 - ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම්, සහ අසම්භව්‍ය වත්කම් ප්‍රමිතයට අනුව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන තුළ ඉහත සඳහන් එක් එක් අවස්ථාව හඳුනාගත යුතු ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

# ප්‍රශ්න අංක 9

19. LKAS 37 (ප්‍රතිපාදන,අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව පහත කුමන අවස්ථාවේ/අවස්ථාවන්හී සමාගමක මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ ප්‍රතිපාදනයක් හඳුනාගනු ලබන්නේ ද?

A – වසරක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකිණීම
B – දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම
C – විකුණන ලද දෝෂ සහිත භාණ්ඩ අළුත්වැඩියා කිරීමට අතීත පරිචය අනුව භාර ගැනීම

I. A පමණි
II. B පමණි
III.A හා B පමණි
IV.A හා C පමණි
V. A, B හා C යන සියල්ලම.



# ප්‍රශ්න අංක 10

සීමිත ගමගේ පොදු සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. 2019.04.01 දිනට වගකීම් සඳහා ප්‍රතිපාදනය රු.525,000ක් විය. 2022.03.31න් අවසන් වර්ෂය සඳහා ගෙවූ වගකීම් සහතික වියදම් සහ හඳුනාගත් වගකීම් සහතික වියදම් පිළිවෙළින් රු.375,000ක් සහ 650,000ක් විය.
LKAS 37 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතය අනුව 2020.3.31 දිනට හඳුනාගත යුතු වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය කොපමණද?



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 11

ප්‍රමිතයට අනුව ප්‍රතිපාදනවල සහ වෙනත් වගකීම්වල ලක්ෂණයන්හි ස්වරූපය දැක්වීම සඳහා පහත වරහන් තුළ දක්වා ඇති නිවැරදි යෙදුම තෝරන්න

| ලක්ෂණය | ප්‍රතිපාදන | වෙනත් වගකීම් |
|---|---|---|
| වර්තමාන බැඳීමක් පැවතීම (ඔව්/නැත) | | |
| පියවීමේදී ගෙවිය යුතු වටිනාකම (නිශ්චිතය/අවිනිශ්චිතය) | | |
| පියවීමේ කාලය (නිශ්චිතය/ අවිනිශ්චිතය) | | |



# ප්‍රශ්න අංක 12

සීමාසහිත ABC සමාගමේ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු සපයා ඇති අතර, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මේවා සැලකිල්ලට ගෙන නොතිබුණි

1 - ආහාර විෂවීමකට වන්දි ඉල්ලා සමාගමේ පාරිභෝගිකයෙකු රු මිලියන 2 ක වන්දියක් ඉල්ලා සමාගමට එරෙහිව නඩුවක් 2025 මාර්තු 30 දින ගොනු කර ඇත. සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමේ දිනය තෙක් පවතින සාක්ෂි මත පදනම්ව, මේ සඳහා සමාගම වගකිව යුතු නොවන බව පෙනෙන්නට ඇති බව සමාගමේ නීති උපදේශකයින් උපදෙස් දී ඇත



JMC vLearning
"your virtual learning partner"

2 - 2023/24 තක්සේරු වර්ෂයට අදාළව රු. මිලියන 1.5 ක වියදම් ඉඩ නොදෙමින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් බදු මත තක්සේරුවක් නිකුත් කර ඇත. මේ සඳහා පිළිතුරු සහ සාක්ෂි කිහිප වාරයක් යැවීමෙන් පසු, 2025 අප්‍රේල් 30 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රු 500,000/- ක වියදම් ඉඩ නොදෙමින් මෙය අවසන් කරන ලදි

3 - විෂමාචාරයක් හේතුවෙන් සේවය අවසන් කරන ලද සමාගමේ හිටපු සේවකයෙකු රු මිලියන 1 ක වන්දියක් ඉල්ලා සමාගමට එරෙහිව නඩුවක් ගොනු කර ඇත. සාක්ෂි මත පදනම්ව, මෙම වන්දි මුදල ගෙවීම සඳහා ඉහළ සම්භාවිතාවයක් ඇති බවට සමාගමේ නීතිඥයින් විශ්වාස කරනු ලබයි අවසානයේදී, වන්දි වශයෙන් රු 800,000/- ක් ගෙවීමට අධිකරණය විසින් 2025 මැයි 15 දින නියම කරන ලදි.



2025 මැයි 30 දින, සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇති බවට උපකල්පනය කරන්න.

ඔබ විසින් කළ යුතු දෑ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව, සීමාසහිත ABC සමාගමේ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන තුළ ඉහත එක් එක් සිදුවීම හදුනාගත යුත්තේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 06)



JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 13

සීමාසහිත බීටා සමාගමට 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමේ දිනය වන 2024 ජූනි 30 දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් සිදුවීම් සිදු වී ඇති බවත්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබූ බවත් කළමනාකාරීත්වය විසින් වාර්තා කර ඇත

(1) සමාගමේ පාරිභෝගිකයෙකු භාණ්ඩයේ ගුණාත්මකභාවය පිළිබඳ ගැටළුවක් හේතුවෙන් සමාගමට එරෙහිව රු 1,000,000/- ක වන්දියක් ඉල්ලා 2024 මාර්තු 31 දින සීමාසහිත බීටා සමාගමට එරෙහිව නඩුවක් ගොනු කර ඇත. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමේ දිනය දක්වා ලැබී ඇති සාක්ෂි මත පදනම්ව, සමාගම මේ සඳහා වගකිව යුතු නොවන බවට සමාගමේ නීති උපදේශකයින් විසින් විශ්වාස කරනු ලැබේ



(2) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ලැබිය යුතු ආදායම් ගිණුමක්, 2024 අප්‍රේල් 10 දින සීමාසහිත බීටා සමාගම විසින් ලියා හැරීමක් සිදු කර ඇත

(3) ආදායම් බදු ගෙවීම සම්බන්ධයෙන්, සමාගම විසින් රු. මිලියන 2 ක බදු ආදායමක් පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ගැටළුවක් පවතින බවට තොරතුරු ඇත. සමාගම විසින් ප්‍රතිපාදන ඇතිකර තිබුණද, 2024 අප්‍රේල් 30 දින රු  මිලියන 1.5 ක වියදමක් ගෙවීමට ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තීරණය කර ඇත

ඔබ විසින් කළ යුතු දේ

ඉහත එක් එක් සිදුවීම සලකා, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත බීටා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න

(ලකුණු 05)





# ප්‍රශ්න අංක 14

සීමාසහිත සිනෝ සමාගම, මෝටර් රථ අමතර කොටස් තොග වශයෙන් විකුණනු ලබන සමාගමකි. සීමාසහිත සිනෝ සමාගමෙහි ගණකාධිකාරීවරයා විසින් 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් කරුණු, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොමැත

(1) 2022 මැයි මාසයේදී, උපයෝගිතා සේවා සපයන ලබන්නෙක් සේවකයෙකු සමාගමේ සේවයෙහි යෙදෙන අතරතුර තුවාල ලබා ඇත. ඔහු විසින් තමාට සිදුවූ තුවාල වෙනුවෙන් රු. මිලියන 5 ක වන්දියක් ඉල්ලා සමාගමට විරුද්ධව නඩු පවරා ඇත. සමාගමේ නීතිඥවරුන්ගේ අදහස වූයේ අදාළ තීන්දුවෙන් නඩුව මුදල් ගෙවීම සඳහා වගකීමට සමාගමට අදාළ වගකීමක් පවතින බවය. 2023 මාර්තු 31 දින, ගුණසේකර විසින් රු මිලියන 3 ක වන්දියක් ගෙවන ලෙස අවසාන වශයෙන් නියම කරන ලදී

(2) මේ අතර, සීමාසහිත සිනෝ සමාගම විසින් රු. මිලියන 9 ක වන්දියක් ඉල්ලා උපයෝගිතා සැපයුම් කරුවකුට විරුද්ධව නඩු පවරා ඇත. මෙම නඩුව සාර්ථක වීමට සහ රු. මිලියන 9 ක වන්දි වශයෙන් ලැබීම සඳහා සමාගමට ඉහළ සම්භාවිතාවක් පවතින බවට සමාගමේ නීතිඥවරුන් වාර්තා පළ කරනු ලැබීය. ගුණසේකර විසින් ඊට අදාළ අවසාන තීන්දුව 2023 ජුනි 15 දින තෙක් ලබා දී නොමැත

(3) 2023 මාර්තු මාසය අවසානයේදී සීමාසහිත සිනෝ සමාගම, නව මෝටර් රථ සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී. මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අවසර ලබාගැනීමේ පියවරක් වශයෙන් සමාගම විසින් මෙම තත්ත්ව නියමයන් සැපිරූ දූෂිතවීම් සහ පරිසර හානිකර පිරිසිදු කිරීම් සඳහා නීතිමය වශයෙන් බැඳී සිටී. මෙම වගකීම්වල වර්තමාන වටිනාකම රු. මිලියන 100 ක් වේ





මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය 2023 ජුනි 15 දින ලබාදී ඇති බැව් උපකල්පනය කරන්න

ඔබ විසින්
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 - ප්‍රතිපාදන, අනාගත වගකීම් සහ අනාගත වත්කම් අනුව 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත සිනෝ සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ඉහත සඳහන් සිදුවීම්වල බලපෑම පැහැදිලි කරන්න

(ලකුණු 05)